රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 18/97

මගේ අංකය: 1/543ඊ/01/02ඩී/7(විෂමතා)7
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1997 .08.08 දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**ලිපිකරු හා සමාන්තර සේවාවන්හි නියුක්ත**
**<u>උපාධිධාරීන් පිළිබඳ තොරතුරු ලබාගැනීම.</u>**

ලිපිකරු හා සමාන්තර සේවාවන්හි නියුක්ත මාණ්ඩලික තනතුරු නොදරණ උපාධිධාරීන්ගේ තොරතුරු කැඳවනු ලැබේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 20/94 න් වැටුප් සහන ලද ලිපිකරු හා සමාන්තර සේවාවන්හි නිලධාරීන් ඇතුළුව මේ දක්වා මෙම සේවාවන්හි නිරත උපාධිධාරීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම මින් අපේක්ෂිතය.

03. මෙම කාර්යයේදී ලිපිකරු හා සමාන්තර සේවා වශයෙන් පහත සඳහන් සේවාවන් අදහස් කෙරේ.

1. සාමාන්‍ය ලිපිකාර සේවය
2. යතුරු ලේඛක සේවය
3. ලඝුලේඛක සේවය
4. පොත් තබන්නා සේවය
5. සරප් සේවය
6. ගබඩා භාරකාර සේවය

04. ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ සේවයේ නිරත ඉහත සඳහන් සේවාවන්හි සියළුම නිලධාරීන්ට මේ පිළිබඳව දැන ගැනීමට සලස්වන්න. මීට අමුණා ඇති ආදර්ශ ආකෘතිය අනුව අදාල නිලධාරීන්ගේ තොරතුරු පිටපත් 3 කින් යුතුව ලබාගත යුතු අතර එහි නිවැරදිතාවය සහතික කරමින් ඉන් එක් පිටපතක් ඔබ කාර්යාලයේ රඳවාගෙන ඉතිරි පිටපත් දෙක 1997.10.06 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය.

ආයතන අධ්‍යක්ෂ ජනරාල්,
3 වන මහල,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

05. පළාත් රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන්ගේ තොරතුරු ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුත්තේ අදාල පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් විසිනි.

06. මෙම තොරතුරු කැඳවනු ලබන්නේ රා.පරි.ච.ලේ.අංක.20/94 හි 03 සහ 05 ඡේදයේ සඳහන්ව ඇති කරුණු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට සහායවීම සඳහාය.

07. අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් දී ඇති බැවින්, නියමිත දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පිළිබඳව සලකා බැලීමක් සිදු නොකෙරේ.

අ.කලෝ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

<u>ආදර්ශ ආකෘති පත්‍රය</u>

ලිපිකරුහා සමාන්තර සේවාවන්හි නියුතු
උපාධිධාරීන්ගේ තොරතුරු පත්‍රිකාව
(පිටපත් 3 කින් යුතුව ඉදිරිපත් කළ යුතුය.)

1. නිලධාරියාගේ නම:-

2. උපන් දිනය-:-

3. සේවා ස්ථානය:-

4. ලිපිනය:-
   (1) රාජකාරී
   (11) පෞද්ගලික

5. දැනට දරණ තනතුරට අදල තොරතුරු:-

(අ) (1) නිරත සේවය:-
   (11) මුල් පත්වීමේ දිනය:-
   (111) දැනට නිරත පන්තිය/ශ්‍රේණිය:-

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 යටතේ වැටුප් අනුග්‍රහ ලබා ඇත්ද යන බව:-

6. ලබා ඇති උපාධිය පිලිබඳ තොරතුරු:-
   (1) උපාධි:-
   (11) විෂයයන්:-
   (111) සහතිකය වලංගු දිනය:-

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි.

අත්සන:-
නම:-

දිනය:-

-------------------------------------------------------------------------------------------------------------
(මෙම කොටස ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කල යුතුය)

මගේ අංකය:-
දිනය:-

ආයතන අධ්‍යක්ෂ ජනරාල්,මෙම ආයතනයේ සේවයේ නියුතු ..........................................................
(තනතුර)
....................................................මයා / මිය / මෙනවිය ඉදිරිපත් කරන ලද අයදුම්පත
(නම)
පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කරමි. එහි සඳහන් තොරතුරු නිවැරදිය.

ආය.තන ප්‍රධානියා